# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 12 දරන
# පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 12 දරන පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 57/90

**පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

“පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පන්නිපිටියේ පිහිටුවා තිබූ හෙයින් ද:

*පූර්විකාව.*

එකී සංගමය පිහිටුවනු ලැබූවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 12 දරන පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු “සංගමය” යනුවෙන් සඳහන් කරනු ලබන පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව, (මෙහි මින්මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය” යන අභිධානය සහ නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වන්නේ ය. තවද ඒ සංස්ථාව විසින් ද ඒ සංස්ථාවට විරුද්ධව ද එම නාමයෙන් සියලුම අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*පන්නිපිටිය තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.*

3. සංස්ථාව මෙයින් පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පරමාර්ථ සඳහා ය :—

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

(අ) බෞද්ධ ධර්මය අනුව ජීවත්වීමට, බෞද්ධ ප්‍රතිපත්ති රැකීමට, බෞද්ධ ධර්මය හැදෑරීමට හා ප්‍රචාරය කිරීමට මිනිසුන්ට ධෛර්ය දීම ;

(ආ) සාමාජික සාමාජිකාවන් අතර සමගිය හා සහයෝගීත්වය දියුණු කිරීම හා ඔවුන්ගේ කායික, මානසික, සාමාජීය හා සංස්කෘතික සංවර්ධනය ඇති කිරීම ; සහ

(ඇ) පළාත්වාසීන්ගේ යහපතට අදාළ වන ගුණාත්මක වර්ධනය, සෞඛ්‍යය සංවර්ධනය හා සුභසාධනය ඇති කිරීම.

ඩී 008415—5,680 (90/03)

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම්, ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයින් සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ එකී රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන ලද සංගමයේ කළමනාකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම, සංස්ථාවේ නිලධරයන් හා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හා ඔවුන්ගේ ධුර කාලය ද සම්බන්ධයෙන් සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහ සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සංගමයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**9.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ගරු ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ තබා ගත යුතු අතර, ගරු ප්‍රධාන ලේකම් සහ සභාපතිවරයා හෝ ගරු භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් කෙනකුද ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද තමන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළයුතු අතර එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි
(විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයක
දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒ
ලබාගත හැකිය.